# මාළු

# යාළුවෝ



තේජිනි දශ්මී යාපා බණ්ඩාර

මාළු යාළුවෝ

තේජිනි දශ්මී යාපා බණ්ඩාර

කතෘ ලිපිනය.

නො. 63/3,
දූල්වල වත්ත,
උඩ දූල්වල,
හල්ඔළුව,
මහනුවර.

| | |
|---|---|
| චිත්‍ර | : තේජිනි දශ්මී යාපා බණ්ඩාර |
| ISBN | : 978-624-208-606-4 |
| ප්‍රථම මුද්‍රණය | : 2025/02/08 |
| කර්තෘගේ වෙනත් කෘති | : වලස් පැංචයි හා පැංචයි. |

පිදුම

මා හට ශක්තියක් වූ

අම්මාටත් තාත්තාටත්

මා හට අකුරු කියා දුන් ආදරණීය වාසනා ගුරුතුමියටත්

මෙම පොත් පිංච උපහාරයක් ම

වේවා.

<u>පෙරවදන</u>

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි..ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුගකැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය.

එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි.

පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අපගේ ගත් කතුවරයන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන හෙල ගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතේ මුල් අවදියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘති ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහාද අත්වැලක් වන නො අනුමානය.

විදුහල්පතිනිය,

ශෂිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

ඔන්න ඉතින් දවසක් මම මාළුවෝ ඇති කරන්න හිතුවා. ඉතින් මම අම්මත් එක්ක ගිහින් මාළු දෙන්නෙක් ම ගත්තා. තව ටැංකියකුත් ගත්තා.



තව මම පාට පාට ගල්, සුදු ගල්, සිප්පි කටු, වැලි ටිකකුත් ගත්තා. මාළු ටැංකිය බොහෝම ලස්සනයි.





මගේ මාළු අම්මාගේ නම තමයි  ජෙනී. මාළු තාත්තාගේ නම ලූක්. ටික කාලයක් යද්දි මාළු අම්මා පැටව් දැම්මා.

මම ඒගොල්ලන් ට වෙලාවට කෑම දානවා. මම මගේ අක්කාත් එක්ක එකතු වෙලා ටැංකිය පිරිසිදු කරනවා මම ඉස්කෝලේ ඇරිලා එනකොට මාළු පැටවු සෙල්ලම් කරනවා. මම ඒ දිහා බලාගෙන ඉන්නවා..



මම හිනාවෙනකොට ඒගොල්ලොත් හිනා වෙනවා.
ඉතින් අපි හැමෝම සතුටින්.



මගේ කැමති ම මාලු යාළුවාගේ නම බිලී. මං ගමන් යන දවසට බිලීවත් අරගෙන තමයි යන්නේ.



මගේ ළඟ මාළු පැටව් ගොඩක් ඉන්න නිසා ඒ ගොල්ලන්ගෙන් ටිකක් මම යහළුවන්ට දුන්නා..



මං ළඟ තවත් මාළු පැටව් ඉතුරු වුණා. එයාලා තාම පුංචි නිසා ඒ ගොල්ලන් ලොකු වුනහම වැවට දාන්න හිතුවා.



මාළු පැටව් මටත් ආදරෙයි. මමත් මාළු පැටවුන්ට ආදරෙයි.





<u>පසුවදන</u>



රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි.

එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි..

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදිශිෂ්‍යාවන් දැක් වූ කැපකිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය..

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් වත් ලබාදිය නොහැකිය.මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි..

මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘතිය රචනා කරයි.

තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනවිරත්න මහලේකම්